# ආ මග සටහන්





දයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික, නියෝජ්‍ය විභාග කොමසාරිස්

## "ගුරුපියා", "ගුරු සීයා" සහ "ගුරු මුත්තා"

මට විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසුව, මා අධ්‍යාපනය ලැබූ, දිවයිනේ හොඳම මධ්‍යම විද්‍යාලයක් ලෙස නම් දරා තිබුණු විදුහලටම, විද්‍යා ගුරු පත්වීමක් ලැබිණ. මට එම විද්‍යාලයයේ උසස් පෙළ පන්තිවල විෂයය දෙකක් ඉගැන්වීමට සිදු විය. නවකයෙකු වූ මට උසස් පෙළට විෂයය දෙකක්ම ඉගැන්වීම තරමක අමාරු වුවත්, විශ්ව විද්‍යාලයයෙන් පිටවූ විගසම තිබුණු ජවයත්, ඉගැන්වීම සඳහා තිබුණු කැමැත්තත් නිසා, ඉගැන්වීමේ කටයුතු නොපිරිහෙලා ඉටු කළෙමි. එමෙන්ම උසස් පෙළ පන්තිවල සිටි සිසුන්ගේ සහ මගේ වය සේ වෙනස, වසර තුන හතරකට වඩා නොවූ නිසා, සිසුන් සහ මා අතර ගුරු ගෝල සම්බන්ධයට වඩා සමීප, සම්බන්ධ යක් ගොඩ නගා ගැනීමටද හැකිවිය. මේ නිසා මම සෑම වෙරක්ම දමා ඉගැන්වූ අතර, සිසුහුද මා කෙරෙහි විශේෂ ලැදිය ාවක් දැක්වූහ. මගෙන් ඉගෙනගත් සිසුන් කිහිප දෙනෙක්ම දෙවන වසර අවසානයේදී විශ්ව විද්‍යාලයට ඇතුලත් වූහ. මොවුන් අතරින් කිත්සිරි ගුරු වෘත්තීය සඳහා විශේෂ කැමැත්තක් දක්වන්නෙකු විය.

වසර කිහිපයකට පසු මට, අධ්‍යාපන අමාත්‍යංශයේම වෙනත් තනතුරක් සඳහා යාමට සිදුවිය. මේ වන විට විශ්ව විද්‍යාල අධ්‍යාපනයට යොමුවූ මගේ සිසුන් කිහිප දෙනෙකු උපාධිය අවසන් කර සිටියහ. ගුරු වෘත්තීය සඳහා කැමැත්තෙන් සිටි කිත්සිරි, විද්‍යාලයයෙන් මා ඉවත්වූ නිසා, ඇතිවූ පුරප්පාඩුව පිරවීම සඳහා පත්කර යැවීම පිණිස, මට නිර්දේශ කළ හැකිවිය. ඔහු ටික කලකින්ම ඉතා ජනප්‍රිය විද්‍යා ගුරුවරයෙකු විය. සෑම වසරකම, ඔහුගෙන් ඉගෙන ගත් සිසුන් කිහිප දෙනෙකුටද විශ්ව විද්‍යාල වරම් හිමිවිය.

මෙසේ වසර දහයක් දොළහක් ගතවන විට කිත්සිරි විදුහලේ නියෝජ්‍ය විදුහල්පති විය. අධ්‍යාපන අමාත්‍යංශයේ උසස් විමක් ලැබූ මාහට, පාසල් වල විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන භාර විය. මෙම වැඩ සටහන නියාමක ව්‍යාපෘතියක් ලෙස පාසල් නියැදියක ආරම්භ කළ යුතුව තිබිණ. මෙවැනි ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඇප කැපවී වැඩ කරන ගුරු මහත්මා මහත්මීන් සිටින පාසල් සොයා ගත හැකි වනුයේ පෞද්ගලික දැන හැඳුනුම් කම් මත පමණක්ම විය.

මාද, ආදී ශිෂ්‍යයකු වන, එසේම වසර කිහිපයක් ඉගැන්වීම කළ දැනට කිත්සිරි ගුරු මහතා නියෝජ්‍ය, විදුහල්පති ලෙස සිටින විදුහල මගේ පාසල් නියැදියට ඇතුළත් කර ගතිමි.

විදුහලේ එවකට සිටි විදුහල්පති තුමා, මා පෞද්ගලිකව හඳුනන අයෙකු නොවීය. ව්‍යාපෘතිය ගැන සාකච්ඡා කිරීමට මම දුර කථනයෙන් කිත්සිරි ඇමතීමි.
"කිත්සිරි.. අධ්‍යාපන අමාත්‍යංශයෙන් පරිසරය සම්බන්ධ පාසල් ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. එය භාරව සිටින්නේ මමයි. මම අපේ ඉස්කෝලෙත් නියාමක පාසලක් ලෙස ඇතුළත් කළා. විදුහල්පති තුමා සමගත් සාකච්ඡා කර මට මේ ගැන කැමැත්ත හෝ නොකැමැත්ත දන්වන්න. කැමතිනම්, අවශ්‍ය ලියකියවිලි සියල්ලම මම හෙටම තැපැල් කරනවා"

"හරි සර්, කිසිම ප්‍රශ්නයක් නැහැ. මම විදුහල්පති තුමාටත් කතාකර, තව ටික වේලාවකින් සර් අමතන්නම්".

කිත්සිරිගෙන් ක්ෂණික ධනාත්මක පිළිතුරක් ලැබිණ. පැය භාගයකට පමණ පසු, මට කිත්සිරිගෙන් නැවත ඇමතුමක් ලැබිණ.

"සර් අපි ඕනෑම ව්‍යාපෘතිය කිරීමට භාර ගන්නම්, මම දැන් නියෝජ්යත විදුහල්පති නිසා රාජකාරි වැඩ කොටසකුත් තිබෙනවා. මම දැන් උගන්වන්නේ එක පන්තියකට විතරයි. අපේ විද්‍යා අංශය භාරව සිටින්නේ මේ විදුහලේම ඉගෙන ගත් මගේ ගෝලයෙක්. එයාගේ නම මල්කාන්ති. එයාගේ මව, සර් මෙහෙ උගන්වන කාලේ ගුරු මණ්ඩලයේ හිටි මිසිස් විජේසිංහ"

ව්‍යාපෘතිය අදාළ ලියකියවිළි හුවමාරු කර ගැනීමෙන් පසු, ඒ පිලිබඳ පළමුවෙනි රැස්වීම සඳහා, තෝරාගත් විදුහල්වල විදුහල්පතිවරු සහ ව්‍යාපෘතියට සම්බන්ධ වීමට බලාපොරොත්තුවන ගුරුවරුන් දෙදෙනෙකු බැගින්ද, අධ්‍යාපන අමාත්‍යංශ යට කැඳවා අවශ්‍ය තොරතුරු ලබාදීම මා විසින්ම කරන ලදී.

එම ව්‍යාපෘතිය කාලීන අවශ්‍යතාවක් වන, පරිසර අධ්‍යාපනය සඳහා ඉතා හොඳ පිවිසුමක් ලබාදෙන, සිසුන්ටද ඉතා වැදගත් එකක් බව කවුරුත් පිළිගත්හ.

ඊට සති දෙකකට පමණ පසු, තම විදුහ ලේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ නිල උත්සවයට සහභාගී වීම සඳහා, කිත්සිරිගේ සහ විදුහල්පති තුමාගේද අත්සන් සහිත ලිපියකින් මටද ඇරයුමක් ලැබිණ. මම ආරාධනය සතුටින් පිලිගතිමි.

නියමිත දින විදුහලට ගිය මට, එහි විශේෂ වෙනස්කම් කිහිපයක් දකින්නට ලැබිණ. වසර තිහකට පමණ ඉහතදී මා සිසුවෙකුව සිටි කාලයේ සහ පසුව මා ගුරුවරයෙකු ලෙස පරිහරණය කල විද්‍යාගාර, දැන් බොහෝ සේ වෙනස් වී ඇත. ඒ කාලයේ මා ආරම්භ කළ උද්භිද උයනේ සිටවූ කුඩා පැලෑටි දැන් මහ ගස් වී තිබේ. මා විසින් ආරම්භ කරනලද ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථානය අංග සම්පූර්ණ පරිසර විද්‍යාගාරයක් වී තිබිණ. තරමක් කුඩාවට තිබුණු පිට්ටනිය දැන් විශාලය. විදුහල් භූමියේ අලුත් තට්ටු ගොඩනැගිලිද රාශියකි.

ව්‍යාපෘතිය හඳුන්වාදීමේ රැස්වීම සුදා නම්කර තිබුනේ විද්‍යාගාරවලට යාබදව, අලුතින් ගොඩ නගා ඇති සම්මන්ත්‍රණ ශාලාවේය. උසස්පෙළ විද්‍යා පන්තිවල සිසු සිසුවියන් සියයක් පමණ ශාලාවේ සිටියහ. කිත්සිරි සහ තවත් ගුරු මහත්මා මහත්මීන්ද හත් අට දෙනෙකු රැස්වීමට සහභාගී වූහ.

රැස්වීම ආරම්භ කළ විදුහල්පති තුමා ව්‍යාපෘතිය පිලිබඳ විස්තරයක් කර, එය විදුහලට ලබාදීමට පුරෝගාමී වූ මා, විදුහලේ ආදී ශිෂ්‍යයකු මෙන්ම, ආදී විද්‍යා ගුරුවරයෙකුද බව පැවසිය. මෙය අසා සිසුහු පුදුමයට පත්වූහ.
ඊළඟට කථාකල නියෝජ්‍ය විදුහල්පති කිත්සිරි මට "ගුරු පියා" ලෙස ආමන්ත්‍රණය කරමින් හිස නමා ආචාර කර, ඒ කාලයේ තොරතුරු රාශියක් මතක් කර දුන්නේය. මීළඟට සභාව ඉදිරියට පැමිණි විද්‍යා අංශ භාර ගුරු මහත්මිය කතාව ආරම්භ කලේ මේ ආකාරයටය

"විදුහල්පති තුමාගෙන් අවසරයි , මගේ ගුරු පියාණන් වන නියෝජ්‍ය විදුහල්පති කිත්සිරි මැතිතුමනි. අද දින මෙහි විශේෂ අමුත්තා ලෙස පැමිණ සිටින අපගේ කිත්සිරි ගුරු පියාගේත් ගුරු පියාණන් වන "ගුරු සීයා"ගෙන්ද අවසරයි"
මෙසේ කියමින් ඉදිරියට පැමිණි ඇය දෑත් එකතු කර මට ආචාර කළාය.
"ගුරු සීයා" යන යෙදුම අසා සිසු සිසුවියන් මහත් හඬින් සිනාසෙමින් අත් පොළසන් දුන්හ.

මටද "ගුරු සීයා" යන කියමන සිතට හොඳින් කා වැදුනේය.

එම හැඳින්වීම් වලට පසුව දිනයේ නියමිත කටයුතු ආරම්භ කිරීමට සැරසෙන විටම ඉදිරි පෙළෙහි වාඩිවී සිටි සිසුවියක් නැගිට, කිත්සිරි ගුරු මහතා අමතා,

"සර් අපේ අමුත්තාට ස්තුති කිරීම සඳහා මටත් වචන කිහිපයක් කතාකිරීමට අවස්ථාවක් දෙන්න" යයි ඉල්ලීමක් කළාය.

කිත්සිරි මහතා, විදුහල්පති තුමාද සමග සාකච්ඡා කර, සිසුවියට අවස්ථාව ලබාදුන්නේය. ඇය විද්‍යා අංශ භාර ගුරු මහත්මියගේ උසස් පෙළ විද්‍යා පන්තියක සිසුවියක්ය.

පිරිස ඉදිරියට පැමිණි ඇය
"විදුහල්පති තුමා ඇතුළු මුළු සභාවෙන් අවසරයි. මගේ පන්ති භාර ගුරු මෑණියෙනි, ගුරු මෑණියන්ගේ ගුරු පියාවන නියෝජ්‍ය විදුහල්පති කිත්සිරි "ගුරු සීයා"ණෙනි, කිත්සිරි ගුරු සීයාගේද ගුරු පියාණන් වන අපගේ විශේෂ අමුත්තා ලෙස පැමිණ සිටින අපගේ "ගුරු මුත්තා"ණෙනි" යි කියමින් මාවෙත පැමිණ දෑත් එකතු කර පහත්වී වැඳ ආචාර කළාය.

මුබරි බාලිකාවක් වන ඇයගේ කතා විලාසයට සහ ඇයගේ ආමන්ත්‍රණ මාලාවට සභාවෙන් පැන නැගුණු සිනහ හඬ සහ අත් පොළසන් නාදය විනාඩි කිහිපයක්ම පැවතිණ.

තවදුරටත් කථාකළ ඇය,
"අප විදුහලට මෙම ව්‍යාපෘතිය ලබාදීම ගැන, අප විදුහලේම ආදී ශිෂ්‍ය සහ ආදී ගුරුවරයෙකුද වන, ගුරු නෑකම වශයෙන් සලකා බලන විට, අපගේ මෙම "ගුරු මුත්තාට", අපගේ පාසලේ සියලූම සිසුන් වෙනුවෙන් අනේක වාරයක් ස්තුති කරමි." යි කියා තම ආසනයට ගොස් හිඳ ගත්තාය. ටික වේලාවක් සිසුන් අතර සහ ගුරුවරු අතරද කසු කුසු පැවතින. කිත්සිරිද සිනහ වෙමින් බිම බලාගෙන සිටියේය. විදුහල්පති තුමා මට කිට්ටුවී

"කෙල්ල කියපු කාරණය හරිම ඇත්ත. බලනකොට මෙතන ගුරු පරම්පරා තුනක්ම සිටිනවානේ. හරියට හරි...., සිසුන්ගේ ගුරු මහත්මිය "ගුරු මෑණියෝ"....., ඒ ගුරු මෑණියන්ගේ ගුරු පියා සිසුන්ට වෙන්නේ "ගුරු සීයා"....., ඒ ගුරු සීයාගේත් ගුරු පියා වන ඔබ තුමාට සිසුන්ගේ නෑකම "ගුරු මුත්තා"....., ඔබ තුමාට දෙන්නට හැකි ඉහලම නම්බු නාමය "ගුරු මුත්තා" කියන එකයි"

මට ලැබුණු "ගුරු මුත්තා" යන නම්බු නාමය ලබාගත හැකි ගුරුවරු ඉතාමත් විරල බව කාර්ය සැසිය අවසානයේදී, මම සිසුන්ට පැහැදිලි කර දුනිමි.

පසු කාලයකදී, ඒ ශිෂ්‍යාවද විද්‍යා උපාධි ගුරුවරියක ලෙස විදුහලට පත්වීමක් ලබා පැමිණි බව මට දැනගන්නට ලැබිණ.



සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au